# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2144/66 – 2019 ඔක්තෝබර් මස 12 වැනි සෙනසුරාදා – 2019.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

සබරගමුව පළාතේ පළාත් සභාව

2018

පස්වන පරිපූරක මුදල් ප්‍රකාශය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හයවන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් 26 වැනි දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27(අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව අවසර දීම - 2018**

01. මෙම අවසරය ''සබරගමුව පළාත් සභාවේ 2018 පස්වන පරිපූරක මුදල් ප්‍රකාශය අනුව වියදම් දැරීම සඳහා වන අවසරය'' ලෙස හඳුන්වන අතර එය 2018.12.26 දින සිට ක්‍රියාත්මක වන්නේය.

02. 2018.11.13 දින අනුමත කරන ලද 2018 හතරවන පරිපූරක ඇස්තමේන්තුවෙන් සංශෝධිත 2018.01.03 දිනැති අංක 2052/15 දරන ගැසට් නිවේදනයේ 2 ඡේදයෙහි ''2018 මුදල් වර්ෂය'' යනුවෙන් සඳහන් කර ඇති, 2018 ජනවාරි මස 01 දිනයෙන් ආරම්භව 2018 දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම් සඳහා අවශ්‍ය වේ යයි තක්සේරු කර ඇති රුපියල් මිලියන තිස්දෙදහස් අටසිය තිස් හතරකුත් හාරසිය අට දහස් එකසිය දොළහකුත් සත තිස් පහක් (32,834,408,112.35) වූ සබරගමුව පළාත් සභාවේ වියදම රුපියල් මිලියන තිස්දෙදහස් නවසිය තිස් හතරකුත් හාරසිය අට දහස් එකසිය දොළහකුත් සත තිස් පහක් (32,934,408,112.35) ලෙස සංශෝධනය කර එම ප්‍රමාණය සබරගමුව පළාත් සභා අරමුදලෙන් වියදම් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට හා ගණන් දීමේ නිලධාරීන්ට මෙයින් අවසර ලබා දෙමි.


1A – PG 4696 – 22 (2019/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඒ අනුව උක්ත සංශෝධිත ගැසට් නිවේදනයේ පළමුවන උපලේඛනය මෙහි පළමුවන උපලේඛනය පරිදි සංශෝධනය කර වියදම් දැරීම සඳහා අවසර දෙනු ලැබේ.

03. මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) ක කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2018 දෙසැම්බර් මස 31 වැනි දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේ ය.

## පළමුවන උපලේඛනය

**පළාත් සභා පොදු සේවාවන් සඳහා ගෙවිය යුතු මුදල්**

**ශීර්ෂ 800 සිට 861 දක්වා**

| | |
|---|---:|
| පුනරාවර්තන වියදම් | 26,799,225,418.00 |
| ප්‍රාග්ධන වියදම් | 6,135,182,694.35 |
| එකතුව | 32,934,408,112.35 |

| *ශීර්ෂය* | *ආයතන හා වැඩසටහන* | *පුනරාවර්තන වියදම රුපියල්* | *ප්‍රාග්ධන වියදම රුපියල්* |
|---|---|---:|---:|
| 800 | **ගරු ආණ්ඩුකාරතුමාගේ කාර්යාලය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 86,043,000.00 | 9,000,000.00 |
| 801 | **පළාත් සභා ලේකම් කාර්යාලය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 220,759,000.00 | 500,000.00 |
| 802 | **පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 18,182,000.00 | 500,000.00 |
| 803 | **සමූපකාර සේවක කොමිෂන් සභා කාර්යාලය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 10,080,468.00 | - |
| 804 | **ප්‍රධාන ලේකම්** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 337,479,937.00 | 591,637,897.46 |
| 805 | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 31,735,036.00 | - |
| 806 | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණය)** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 44,299,500.00 | - |
| 807 | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රම සම්පාදන)** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 44,876,000.00 | - |
| 808 | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)** | | |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 235,773,000.00 | - |
| 809 | **පළාත් ආදායම් දෙපාර්තමේන්තුව** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 60,768,000.00 | - |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| 810 | **නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, පළාත් පාලන, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමූපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, වතු සුබසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් සහ ආගමික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 170,722,000.00 | 5,000,000.00 |
| | 47 වැනි වැඩසටහන - ප්‍රවාහන සේවා | | 30,000,000.00 |
| | 49 වැනි වැඩසටහන - විදුලිබල හා බලශක්ති සේවා | | 25,000,000.00 |
| | 53 වැනි වැඩසටහන - සමූපකාර සංවර්ධනය | | 2,000,000.00 |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධන | | 337,778,000.00 |
| | 61 වැනි වැඩසටහන - නිවාස හා ප්‍රජා පහසුකම් | 2,010,000.00 | 26,000,000.00 |
| | 63 වැනි වැඩසටහන - වැවිලි යටිතල පහසුකම් හා වතු නිවාස | | 30,000,000.00 |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | | 722,074,115.02 |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | | 200,000,000.00 |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | | 75,000,000.00 |
| | 93 වැනි වැඩසටහන - ආගමික හා සංස්කෘතික කටයුතු | | 137,250,000.00 |
| | 96 වැනි වැඩසටහන - කාන්තා සංවර්ධනය | | 7,000,000.00 |
| 811 | **සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 250,243,286.00 | |
| | 71 වැනි වැඩසටහන - රෝහල් සේවාවන් | 5,420,630,479.00 | |
| | 72 වැනි වැඩසටහන - මහජන සෞඛ්‍ය සේවාවන් | 1,027,948,430.00 | |
| 812 | **ආයුර්වේද දෙපාර්තමේන්තුව** | | |
| | 73 වැනි වැඩසටහන - දේශීය වෛද්‍ය සේවාවන් | 457,869,000.00 | |
| 813 | **සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව** | | |
| | 53 වැනි වැඩසටහන - සමූපකාර සංවර්ධනය | 94,014,000.00 | |
| 814 | **පළාත් පාලන දෙපාර්තමේන්තුව** | | |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 2,102,824,064.00 | |
| 820 | **පළාත් මාර්ග සංවර්ධනය, ග්‍රාමීය යටිතල පහසුකම්, සංචාරක සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 70,079,400.00 | |
| | 50 වැනි වැඩසටහන - ඉදිකිරීම් හා මාර්ග නඩත්තුව | 502,500,000.00 | 505,000,000.00 |
| | 52 වැනි වැඩසටහන - ප්‍රාදේශීය සංවර්ධනය | | 28,000,000.00 |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | | 187,930,000.00 |
| 821 | **ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව** | | |
| | 90 වැනි වැඩසටහන - විනෝද කටයුතු හා ක්‍රීඩා | 40,509,000.00 | |

| *ශීර්ෂය* | *ආයතන හා වැඩසටහන* | *පුනරාවර්තන වියදම රුපියල්* | *ප්‍රාග්ධන වියදම රුපියල්* |
|---|---|---|---|
| 830 | **සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක, ග්‍රාම සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත අමාත්‍යාංශය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 49,626,667.00 | - |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | | 45,500,000.00 |
| | 60 වැනි වැඩසටහන - ප්‍රජා සංවර්ධනය | 27,634,000.00 | 93,970,000.00 |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | | 121,100,000.00 |
| 831 | **කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව** | | |
| | 51 වැනි වැඩසටහන - කර්මාන්ත සංවර්ධනය | 133,934,000.00 | |
| 832 | **පරිවාස, ළමාරක්ෂක හා සමාජසේවා දෙපාර්තමේන්තුව** | | |
| | 95 වැනි වැඩසටහන - සමාජ ආරක්ෂණය | 320,082,671.00 | |
| 840 | **අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 107,555,334.00 | 1,800,000,000.00 |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | | 171,800,000.00 |
| | 81 වැනි වැඩසටහන - ද්විතියික අධ්‍යාපනය | | 583,872,681.87 |
| | 93 වැනි වැඩසටහන - ආගමික හා සංස්කෘතික කටයුතු | 13,800,000.00 | 35,150,000.00 |
| 841 | **අධ්‍යාපන දෙපාර්තමේන්තුව** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 501,136,000.00 | |
| | 80 වැනි වැඩසටහන - ප්‍රාථමික අධ්‍යාපනය | 4,654,975,000.00 | |
| | 81 වැනි වැඩසටහන - ද්විතියික අධ්‍යාපනය | 9,081,860,023.00 | |
| | 87 වැනි වැඩසටහන - අධ්‍යාපන සහභාගීත්වය වැඩිදියුණු කිරීම | 39,664,000.00 | |
| | 88 වැනි වැඩසටහන - අධ්‍යාපන සැලසුම්කරණය පාලනය හා සේවා සැපයීම | 7,935,000.00 | |
| 850 | **ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 61,697,935.00 | 20,000,000.00 |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | | 5,500.000.00 |
| | 43 වැනි වැඩසටහන - වාරිමාර්ග හා ජල කළමනාකරණය | | 94,620,000.00 |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | | 139,000,000.00 |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | | 90,000,000.00 |
| | 55 වැනි වැඩසටහන - ආහාර සුරක්ෂිතතාව පවත්වාගැනීම | | 15,000,000.00 |
| 851 | **ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව** | | |
| | 40 වැනි වැඩසටහන - ඉඩම් පරිපාලනය හා සංවර්ධනය | 60,551,000.00 | |

| ශීර්ෂය | ආයතන හා වැඩසටහන | පුනරාවර්තන වියදම රුපියල් | ප්‍රාග්ධන වියදම රුපියල් |
|---|---|---|---|
| 852 | **කෘෂිකර්ම දෙපාර්තමේන්තුව** | | |
| | 44 වැනි වැඩසටහන - කෘෂිකාර්මික සංවර්ධනය | 222,449,500.00 | |
| 853 | **සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව** | | |
| | 45 වැනි වැඩසටහන - පශු සම්පත් සංවර්ධනය | 267,784,688.00 | |
| 861 | **පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව** | | |
| | 03 වැනි වැඩසටහන - පළාත් පරිපාලනය | 19,194,000.00 | |
| | | **26,799,225,418.00** | **6,135,182,694.35** |

**නිලූකා ඒකනායක,**
ගරු ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත් සභාව.

2018 දෙසැම්බර් මස 26 වැනි දින.

**අධිකාරි බලය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමුව පළාතේ හය (6) වන පළාත් සභාවේ නිල කාලය 2017 සැප්තැම්බර් මස 26 දිනෙන් අවසන් වූ බැවින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 27 (අ) වගන්තිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙම පළාත් සභාවේ 2018 වර්ෂය සඳහා වන පස්වන පරිපූරක මුදල් ප්‍රකාශය අනුව වියදම් දැරීමට එම පළාතේ ප්‍රධාන ලේකම්ට සහ ගණන් දීමේ නිලධාරීන්ට මෙයින් අවසර දෙමි.

ඒ අනුව 2018 වාර්ෂික මුදල් ප්‍රකාශයේ (සංශෝධිත) සඳහන් පරිදි 2018 ජනවාරි 01 දිනෙන් ආරම්භව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම සඳහා අවශ්‍ය වේ යැයි තක්සේරු කර ඇති රුපියල් මිලියන තිස්දෙදහස් අටසිය තිස් හතරකුත් හාරසිය අට දහස් එකසිය දොළහකුත් සත තිස් පහක් (32,834,408,112.35) වූ සබරගමුව පළාත් සභාවේ වියදම රුපියල් මිලියන තිස්දෙදහස් නවසිය තිස් හතරකුත් හාරසිය අට දහස් එකසිය දොළහකුත් සත තිස් පහක් (32,934,408,112.35) ලෙස සංශෝධනය කර එම ප්‍රමාණය සබරගමුව පළාත් සභා අරමුදලෙන් වියදම් දැරීමට මෙම අවසරය ලබා දෙමි.

මෙම අවසරය සබරගමුව පළාතේ හත්වන (7) වන පළාත් සභාව රැස්වීම පිණිස කැඳවනු ලබන දිනයෙහි හෝ පළාත් සභාවේ කටයුතු කිරීම නැවත ආරම්භ කරන දිනයෙහි හෝ සිට මාස තුනක (03) ක කාලසීමාවක් ඉකුත් වන දිනය හෝ 2018 දෙසැම්බර් මස 31 වැනි දිනය හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන්නේය.

**නිලූකා ඒකනායක,**
ගරු ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

2018 දෙසැම්බර් මස 26 වැනි දින.

10 - 1012

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.